# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 223/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 07/02/2024<br>පැය 2200 |

## මාධ්‍ය නිවේදනය

### ක්‍රිකට් තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රිකට් සංගමය මගින් සංවිධානය කරනු ලැබූ **"2023 ශ්‍රී ලංකා රාජ්‍ය සේවා එක් දින ක්‍රිකට් තරගාවලියේ"** අවසන් මහා තරඟය 2024.02.07 වන අද දින බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බලකා *මූලස්ථාන* ක්‍රීඩාංගනයේ දී පැවැත්විණි.

මෙම තරගාවලියේ ඒ කාණ්ඩයේ කණ්ඩායම් 10 ක් අතුරින් ශ්‍රී ලංකා පොලිස් ක්‍රිකට් කණ්ඩායම හා පොලිස් විශේෂ කාර්ය බලකා ක්‍රිකට් කණ්ඩායම අවසන් මහා තරගය සඳහා තේරී පත් වූ අතර, එහි දී ශ්‍රී ලංකා පොලිස් ක්‍රිකට් කණ්ඩායම ශූරතාව දිනා ගන්නා ලදී. තරගාවලියේ හොඳම පන්දු යවන්නා ලෙස කඩුලු 29 ක් දවා ගත් පොලිස් සැරයන් 40246 මහේෂ් ප්‍රියදර්ශන නිලධාරියා සම්මාන දිනා ගන්නා ලදි.

තරඟාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවය මහජන ආරක්ෂක ගරු අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා, පොලිස් විශේෂ කාර්ය බලකා අණදෙන නිලධාරි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතා, ප්‍රවීණ ක්‍රිකට් විනිසුරු කුමාර ධර්මසේන මහතා, ශ්‍රී ලංකා ක්‍රිකට් තේරීම් කමිටුවේ සභාපති උපුල් තරංග මහතා, ශ්‍රී ලංකා ක්‍රිකට් තේරීම් කමිටු සාමාජික අජන්ත මෙන්ඩිස් මහතා ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කමල් පුෂ්පකුමාර මහතා ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රිකට් සංගමයේ සභාපති ලෙස ද, ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රිකට් සංගමයේ ලේකම් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ එම්.කේ.සී. නාලක මහතා කටයුතු කරනු ලබන අතර, තරඟාවලිය සාර්ථක කර ගැනීම සඳහා එම මහත්වරුන් සිදු කළ සේවය අගයමින් වැඩබලන පොලිස්පති තුමන් විසින් සමරු තිළිණ ප්‍රදානය කරන ලදී.

පොලිස් ක්‍රිකට් කණ්ඩායමේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා ද, ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කමල් පුෂ්පකුමාර මහතා ද, කළමනාකරු

ලෙස ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.එම්.සී. සමරකෝන් මහතා ද සහ පුහුණුකරු ලෙස පොලිස් සැරයන් 42296 වරුණ රාමනායක යන මහත්වරුන් කටයුතු කරනු ලබයි.







SLSSCA
Established in 1907
Sri Lanka Cricket








මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.